

# හතර වරිගයම

සිරිමා සිරිවර්ධන මදුනායක

සාදු.......... සාදු..............

දෝංකාරය හඬින් මම තිගැස්සුනා. ඒ හඬ ඇසුනේ මගේ පපුකුහරයෙන්ද කියලා මො-හොතක් මට හිතා ගන්න බැහැ. මුළු ධර්මශාලාවෙන් නැගුණු ඒ හඬ දස අතර පැතිරීලා. දොහොත් මුදුනින් තබාගත් අත් දෙක නොහැරම වසාගත් දෙනෙත් ටිකෙන් ටික හැර ධර්මශාලාව දෙසට නෙත් යොමු කලේ ගැහෙන සිතින්. අහෝ! මෙහෙම දසුනක්? මගේ දෙනෙත් කොච්චර පිං කරලා ඇද්ද? මට හිතුනා.

මගේ සිත කෙමෙන් කෙමෙන් අතීතයට දිව යන්න පටන් ගත්තේ මට හොරෙන්. යමක් කමක් ඇති පවුලක බාලයා වෙලා ඉපදුන මට හැමෝගෙන්ම ආදර සැලකිලි ලැබුණු හැටි. අප්පච්චි මට කථාකලේ බඩපිස්සී කියලා. අද වගේ මතකයි. ඔබ අතරවාරයේ තමයි සිරිපාලව මට මුනගැසුනේ. අපේ ගෙදර වත්ත පිටිය වැඩකරන්න ආපු කාත්කවිරුත් නැති සිරිපාලට මගේ හිතගියේ කාටත් හොරා. අන්තිමේදී දෙමව්පියන්ට පිටුපාලා ඔහුත් සමග අලුත් කැදැල්ලක් තනන්නට යන්න මට සිදුවුනා. දුප්පත් වුනත් කුලී වැඩ කරලා මටත් අපේ පවුලට අලුතින් එකතු වූ පුතුන් දෙදෙනාටත් සුර සැප දෙන්න ඔහු වෙහෙසුන හැටි මට තාම මතකයි. වේලක් හැර වේලක් කාල අපේ පුංචි කැදැල්ලේ බොහොම සතුටින් ජීවත් වෙන්න ලැබුනේ මොනතරම් කෙටි කාලයක්ද කියලා මට හිතෙනවා. අපේ ජීවිතවලට කනකොකා හැඩුවේ බලාපොරොත්තු නොවූ අවස්ථාවක. මහ වැස්සේ රාළහැමිගේ වත්තේ මුරට පොල් කඩන්න ගිහින් ලිස්සලා වැටිලා වෙච්ච අපරාධයක මහත. ඔහු මියැදුනා. ඔහුගේ දේහය අසල්වාසීන් විසින් පැලට ඔසවාගෙන එනවිට මට හිතුනා මමයි දරුවොයි මහා පොලවට කඩා වැටුනා නේද කියලා. අන්තිමේදී පියා නොමැති අඩුව පිරිමහන්න මවත්, පියාත් වෙන්න මටම සිදු වුනේ. මේ අභාග්‍ය කාලයෙන් පස්සේ, සිරිපාල මිය ගියේ මගේම කරුමයට අනේකවාරයක් හිතුනා. අඬලා පලක් නැති නිසා හිත දැඩි කරගෙන අනාගතයට මූණ දෙන්න මම අධිෂ්ඨාන කරගත්තේ ඊට පසුවයි.

ගමේ වලව්වේ හාමිනේගේ කුස්සියේ වැඩ කරලා ලැබෙන සොච්චමෙන් අදින්න තියා කන්නවත් දරුවන්ට මදි නිසා රබර්වත්තේ හාමුට බැගෑපත් වෙලා කිරි කට්ටියක් ඉල්ලගෙන උදේ රැයින්ම රස්සාවට ගිහින් හවස් වරුවේ වලව් හාමිනේගේ ගෙදර වැඩ කරන්න පුරුදු වුනා.

"ඔච්චර මහන්සිවෙන්න එපා කුසුමලතා" "මොකෝ උඹගේ ලමයි ලියන මහත්තුරු කරන්නද? ටිකක් ලොකු වුනාම වලව්වට එවපං. මෙහේ කුලී වැඩ ඕනේ තරම්" හැමදාම හාමිනේගේ ගෝරනාඩුව.

රෑ වෙන්න කලියෙන් වැඩපල ඉවර කරලා කන්න දීපු බත් පිගානත් අරගෙන ලහි ලහියේ මම ගෙදර එන්නේ පොඩි උන් මගබලාගෙන ඉන්නවා නේද? කියලා අනික උනුත් වලව්වේ බත් කන්න කෑදයෙන් ඉන්න නිසාත්. කොහොම කොහොමහරි දුකසේ දරුවන්ව උස්මහත් කරනන් මම වෙහෙ-සුනා. අවු. 14-15 වෙනකොට ලොකු කොලුවා ටිකෙන් ටික වෙනස් වෙන්න පටන් ගත්තේ මගේ ඇස්පනා පිටමයි. ඉස්කෝලෙන් කට්ටි පැනලා දඩබ්බර කොලු දුනට එකතු වෙන්න පටන් ගත්තා. ඒ විතරක් නෙමෙයි ගෙදර රෑ ජාමෙට එන්නත් පුරුදු වුනා. දැනමුතුකම් කීවත් කොලුවා නෙමෙයි මායිමකට ගත්තේ. අන්තිමයට වුනේ කොලුවා ගෙදර නෑවිත්ම ඉන්න එක. ලොකු කොලුව මගෙන් ඈත්වෙනකොට බාලයා මට හුඟක් ලංවෙන්න පටන් ගත්තා. මේ ලෝකයේ තව පටචාරලා කොච්චර ඇති නේද කියලා හිතහදාගෙන බාලයාගේ ජීවිතය සරිකරන්න වෑයම් කලා.

මේ අතර සිරිපාල මිය ගොස් වසර 7ක් සම්පූර්ණ වන නිසා පුළුවන් විදිහකට ගමේ පන්සලට දානේ වේලක් දෙන්න ඕනේ කියලා හිතාගෙන පන්සලට ගියේ ලොකු හාමුදුරුවන්ට ආරාධනා කරන්න.

"උපාසකම්මේ බුදුන් වැඳලා දරුවත් එක්ක මාව මුණගැසෙන්න ආවනං"

හාමුදුරුවන්ගේ හඬින් මම තිගැස්සුනා. ලොකු කොලුවා පන්සලෙන් මොනවාහරි හොරාගෙන වත්ද? මගේ හිත ප්‍රශ්න කරනවා. බුදුන් වැඳලා ගැහෙන සිතින් ලොකු හාමුදුරුවන්ගේ දෙපා වැඳලා එකත්පසව ඉඳ ගත්තා.

"සිරිපාලගේ පාංශකූලටය ආපු දවසෙම මේ දරුවා දැක්කම මට තේරුනා පිංවන්ත දරු-වෙක් කියලා."

"සාසනේට පූජා කරන්න" මම හොඳ පණ්ඩිත නමක් කරන්නම්"

"අනේ හාමුදුරුවනේල මට ඉන්නේ ඔච්චරයි"

"අනේ කියන්න එපා උපාසකම්මේ, දන්නවද සාසනේට දරුවෙක් පූජා කරනවා කියන්නේ, හතරවරිගයම නිවන් දිනවා කියන එක නොවැ"

ලොකු හාමුදුරුවන්ගේ හඬ මහ මෙරක් වගේ මට දැනුනා. මම කොලුව දිහා බැලුවා. ඒ වෙලාවේ කොලුවාගේ මුණට පුන්සඳ පායලා වගේ.

මම කොලුවව සාසනේට පූජා කළා, ඒ දැනට අවුරුදු 5කට පෙර.

අද පොසොන් පුර පොහෝදා. අද මගේ පුතා බුද්ධ පුත්‍රයෙක් වෙලා. වසර 4කට පසුව උපසම්පදාව ලැබලා අලංකාර පෙරහරකින් ගමේ පන්සලට වැඩම කරලා. විශේෂ මණ්ඩපයකින් වැඩ හිඳ මංගල ධර්ම දේශනාව පවත්වනවා. මේ ලෝකයේ සිටින උත්තරීතර මාතාවගෙන් කෙනෙක් මමත් නේද? මට හිතෙනවා. සතුට දරාගන්න බැහි. අභිංසක ආඩම්බරයක් මගේ හිතට ඇතුල් වෙලා. කසාවතෙන් සැරසිලා බැබලි බැබලී ධර්ම දේශනා කරන අපූරුව. සැදැහැවතුන් ගල් රූප වගේ බණ අහනවා. දර්ම දේශනාව අවසානයේ සාදුකාර මැද්දේ පොඩි හාමුදුරුවන්ගේ දෙපා වඳින්න පිරිස පෙල ගැසිලා.

"එන්න කුසුමලතා පාඩි හාමුදුරුවන්ට වඳින්න" කවුදෝ මට අමතනවා. මගේ උරහිසට අත තියාගෙන වලව්වේ හාමිනේ. දෛව්‍යවත මහත. මාව වත්කම් කරගත්ත වලව්හාමිගේ සෙනගපිරා ගෙන පොඩි හාමුදුරුවන් අභියසට කැඳවාගෙන ගියා. දරාගත නොහැකි දැරූ සෙනෙහසින් හා බුදු බැතියෙන් හා ඉහවහා ගිය සොම්නසින් මම පොඩි හාමුදුරුවන්ගේ දෙපා මුල හිස තබාගෙන වැන්දා. ඒ අතර මගේ ඇසින් ගලා එන කඳුලැලි පොඩි හාමුදුරුවන්ගේ දෙපා තෙමාගෙන ගලා යනවා මම බලාගෙන.

සාදු! සාදු! ....... දෝංකාර හඬ නැවතත් රැව් දෙනවා. ඒ හඬ මුළු පන්සල් භූමිය පුරාම විසිරීලා මුළු අහස් තලයම වසාගෙන. ඒ අතරින් තරුකැට පිරිවරා ගෙන පොසොන් සඳ බැබලෙනවා. තරුකැට මැදින් පුංචිම පුංචි තිතක් මට පේනවා. ඒ තිත අතරින් සිරිපාල මා දිහා බලාගෙන හිනාවෙනවා.

සාදු.... සාදු...... සාදු................ අපි හතරවරිගයම නිවන් දකිනවා.

මම මොරදීලා කෑ ගැසුවා. නමුත් ඒ හඬ මගේ හද පතුලේ පමණක් දෝංකාර දුන්නා.

Splendid Solutions

Accounting & Bookkeeping Specialist

- Software Installation and training
- Bookkeeping services for all business entities
- Payroll services
- Tailored accounting solutions
- Financial and management reporting
- Cash Flow, Budgeting, Variance analysis
- Business Activity Statements (BAS)
- Servicing all areas



Suresh Perera B.Bus (Acc.), MAFM

155 Shaws Rd Werribee VIC 3030

M: 0422 027 042

www.splendidsolutions.com.au

sperera@splendidsolutions.com.au

කුට්ටම් පොකුණ

නොවැළැක්විය හැකි හේතුමත මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න



ලක්ෂ්මන් කොඩිතුවක්කු

